පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව
-----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පදවි ශ්‍රී පුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලේඛණය අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු. 387,389 ක් වූ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ශේෂය රු. 307,979 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ශේෂය රු. 79,410 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියෙන් ඉදිකර ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලද පැරණි මැදවච්චිය, සේවා ජනපදය, ජයන්ති වැව, කොලොන්ගොල්ල යන ජල ව්‍යාපෘතීන් හි වටිනාකම රු. 149,452,290 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
-----------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා රු.11,628,486 ක වටිනාකම වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පළාත් මූල්‍ය රීති අංක 237 | නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 16,702 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) පළාත් පාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 10 සම්න්ධයෙන් එසේ කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,029,656 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,358,125 ක් විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු. 2,613,489 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,671,531 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| බදු කුලී | 750 | 698 | 234 |
| බලපත්‍ර ගාස්තු | 194 | 194 | 89 |
| වෙනත් ආදායම | 8,654 | 9,282 | 4,694 |

2.2.2 කඩ කාමර කුලී

-----------------

වර්ෂ 02 සිට වර්ෂ 19 ක් දක්වා වූ කාල පරිච්ඡේදයකට අයත් එකතුව රු. 234,039 ක් වූ ලැබිය යුතු කඩ කාමර කුලී අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

(අ) 2015 පෙබරවාරි 07 දින පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව නිර්දේශිත කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග විගණිත දිනය වූ 2015 ජූලි 17 දින දක්වාත් ගෙන නොතිබුණි.

(ආ) වසර 08 ක සිට පැවත එන සභාව විසින් ගෙවූ එකතුව රු. 180,664 ක් වූ අත්තිකාරම් වසර 08 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබියදීත් විගණිත දිනය වූ 2015 ජූලි 17 දින දක්වාත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2007 අංක 13 හා අංක 18 දරන මුදල් සංශෝධන පනත් වලින් සංශෝධිත 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරිම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 38,670,526 කින් අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 96,676 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමකින් තොරව රු. 84,736,340 ක ගොඩනැගිලි ඉදිකර ඇතත්, එම ඉදිකිරීම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ඉඩම් හා ගොඩනැගිලි ලෙස දක්වා තිබුණි. සභාව විසින් මෙම ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ) නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ප්‍රජා සහභාගීත්වයෙන් බට එලීම සඳහා ප්‍රා දේශීය සභාවට 2012 සහ 2013 වර්ෂයන් වලදී ලබා දී තිබූ UPVC බට සහ සවිකිරීම් වලින් ඉතිරි වී තිබූ විශාල බට තොගයක් පදවි ශ්‍රී පුර , ජයන්ත පුර සහ සමන්පුර යන ගබඩාවල අවිධිමත් ලෙස ගබඩා කර තිබුණි. එම බට තොගය විධිමත්ව ගබඩා කර වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් වෙනත් කාර්යයක් සඳහා හෝ භාවිතා කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව කොන්ත්‍රාත්කරු සමග අත්සන් කර තිබූ ගිවිසුම ප්‍රකාරව රු. 4,895,124 ක කොන්ත්‍රාත් වටිනාකමකට ඉදිකරන ලද සිංහපුර ග්‍රාම සේවා වසමේ මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානය 2014 දෙසැම්බර් 31 දින සභාවට භාර දී තිබුණි. ගොඩනැගිල්ලට විදුලි සහ ජල සැපයුම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සභාව විසින් විගණිත දිනය වූ 2015 ජූලි 17 දින දක්වා ගෙන නොතිබීම නිසා සායන මධ්‍යස්ථානය ඉදිකිරීමේ අරමුණ වූ පරණ මැදවච්චිය ග්‍රාමසේවා වසමේ පවුල් 250 කගේ කාන්තා හා ළමා සෞඛ්‍ය ගැටළුවලට විසඳුම් ලබා දීම මාස 07 කට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි.

3.3. පාරිසරික ගැටළු

--------------------

පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 09 ට අදාල ජනතාව පානීය ජලය නොමැති වීමෙන් දැඩි අපහසුතාවයකට පත් වී තිබූ අතර, ප්‍රාදේශීය සභා වාර්තා අනුව වකුගඩු රෝගීන් 304 දෙනෙකු 2014 වර්ෂය අවසාන වන විට වාර්තා වී තිබුණි. නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය මගින් කරන ලද ශක්‍යතා අධ්‍යන වාර්තා අනුව මෙම කොට්ඨාශයේ ජලයෙහි Turbidity ,Ammonia, Phosphate, Nitrite, Manganese, Alkalinity, Hardness අනුමත ප්‍රමාණය ඉක්මවා ඇති බව නිරීක්ෂණය කර තිබුණි. Dug Wells සහ Tube Wells වලින් ලබා ගන්නා ජලය පිරිපහදු කිරීමකින් තොරව ඍජුවම ජනතාවට බෙදා හැරීම සඳහා පරණ මැදවච්චිය , සේවා ජනපදයථ ජයන්ති වැව, කොලොන්ගොල්ල යන ජල යෝජනා ක්‍රම ඉදිකිරීම නිසා බීමට සුදුසු පානීය ජලය ජනතාවට බෙදා හැරීමට සභාවට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

4 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

--------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 02 | 01 | 01 |
| ද්විතික මට්ටම | 17 | 10 | 07 |
| තෘතීය මට්ටම | 24 | 21 | 03 |
| එකතුව | 43 | 32 | 11 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ආයුර්වේද වෛද්‍ය නිලධාරී, කළමනාකරණ සහකාර, තාක්ෂණික නිලධාරී, පුස්තකාලයාධිපති , විදුලි කාර්මික නිලධාරී සහ රියදුරු තනතුරුවල වර්ෂ 02 සිට 05 දක්වා කාලපරිච්ඡේදයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනයවූ 2015 ජූලි 17 දින වන විටද කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ ආදායම් පරිපාලනය

(ඇ වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කලමනාකරණය